# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

## දේශීය ආදායම් (සංශෝධන)

**2017 අංක 24 දරන දේශීය ආදායම් පනත**
**සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා විසින්
2026 මාර්තු මස 17 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2026 පෙබරවාරි මස 24 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

**[55 වන පනත් කෙටුම්පත]**


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 230.40** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය***: මේ වගන්තිය මගින්, (මෙහි මින්මතු “ප්‍රධාන ප්‍රඥප්තිය” යනුවෙන් සඳහන් කරනු ලබන) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 8 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ යම් තැනැත්තකුගේ වෙනත් මූලාශ්‍රවලින් ලැබෙන ලැබීම් සහ ලාභ ගණනය කිරීමේ දී මෝටර් වාහන උපලබ්ධි කිරීමෙන් ලැබෙන ලැබීම් බැහැර කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***3 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ -

(අ) බැංකු ගිණුමකට තැන්පතුවක් ආකාරයෙන් ගෙවීමක් සිදු කර ඇත්තේ නම් මිස, ගනුදෙනුවක් සඳහා වන ගෙවීම් සම්බන්ධයෙන් අඩු කිරීමක් සඳහා ඉඩ නොදීමට විධිවිධාන සැලැස්වීම වේ; සහ

(ආ) සිංහල භාෂා පාඨයේ යම් වරදක් නිවැරදි කිරීම වේ.

***4 වන වගන්තිය***: මේ වගන්තිය මගින් පැහැදිලිභාවය වැඩි කිරීමට ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***5 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ශ්‍රී ලංකා ආණ්ඩුවට හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද හෝ පිහිටුවනු ලැබ ඇති ලෙසට සලකනු ලබන යම් විශ්වවිද්‍යාලයකට වත්කම් පැවරීම සම්බන්ධයෙන් ඒ වගන්තියේ අදාළත්වය දීර්ඝ කිරීම වේ.

***6 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ඇතැම් සුදුසුකම් ලබන ගෙවීම් ඉදිරියට ගෙන යාමට සහ ඒවා අනුයාත තක්සේරු වර්ෂවල දී අඩු කිරීමට විධිවිධාන සැලැස්වීම වේ.

***7 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 52අ වන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ පුද්ගලයකුගේ තක්සේරු කළ හැකි ආදායම ගණනය කිරීමේ දී ඇතුළත් කළ යුතු සහ බැහැර කළ යුතු, ජීවිත රක්ෂණ ඔප්පුවක් යටතේ ලැබෙන ලැබීම් වර්ග නිශ්චිතව දැක්වීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***8 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ඒකක භාරයක් විසින් ඒකක දරන්නකුට සහතිකයක් ලබාදීමට අපොහොසත් වීමේ ප්‍රතිවිපාක සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම වේ.

***9 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ -

(අ) ඒ වගන්තියේ පැහැදිලි බව වැඩි කිරීම වේ; සහ

(ආ) රක්ෂණ ව්‍යාපාරයට අදාළ වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට සිදු කරනු ලබන ප්‍රතිශෝධනවලට අනුකූලව අවශ්‍ය වන ගැලපීම් නිශ්චිතව දැක්වීම සඳහා කොමසාරිස් ජනරාල්වරයාට හැකියාව ලබාදීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***10 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ඇතැම් කොන්දේසිවලට යටත්ව පුණ්‍ය ආයතනවලට බදු බැරක් ප්‍රදානය කිරීමට කොමසාරිස් ජනරාල්වරයාට හැකියාව ලබාදීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***11 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 69 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ආදායම් බදු කාර්ය සඳහා පුද්ගලයකු වාසිකයකු ලෙස සලකනු නොලැබිය යුතු අවස්ථානුගත තත්ත්වයන් සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***12 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ශ්‍රී ලංකාවේ මූලාශ්‍රයක් නොමැති සහ ශ්‍රී ලංකාවෙන් භාණ්ඩ හෝ සේවා අපනයනය කිරීමේ දී දරන ලද ගෙවීම් ආදායම් ගණනය කිරීමේ දී අඩු කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***13 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ 2025 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි නිර්වාසික තැනැත්තකු විසින් ප්‍රධාන කාර්යාලයේ වියදම් අඩු කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***14 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට බදු වාර්තා ගොනු කිරීමට නියම කිරීම සහ රඳවා ගැනීමේ බද්දෙන් ඇතැම් පොලී ගෙවීම් නිදහස් කිරීමට විධිවිධාන සැලැස්වීම වේ.

***15 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ස්වාධීන සේවා සපයන්නන් සම්බන්ධයෙන් රඳවා ගැනීමේ බද්ද අදාළ වන්නා වූ විෂය පථය පුළුල් කිරීම වේ.

***16 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ රඳවා ගැනීමේ බද්ද අඩු කිරීම සම්බන්ධයෙන් වාර්ෂික ප්‍රකාශ සහ ත්‍රෛමාසික ප්‍රකාශ ගොනු කිරීම සඳහා වන කාර්යපටිපාටි, ආකෘති සහ ආකෘතිපත්‍ර නිශ්චිතව දැක්වීමට කොමසාරිස් ජනරාල්වරයාට හැකියාව ලබාදීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***17 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ රඳවා ගැනීමේ අනුයෝජිතයකු විසින් රඳවා ගැනීමේ සහතිකයක් ගාස්තු අයකිරීමකින් තොරව නිකුත් කරනු ලබන බවට සහතික කිරීම වේ.

***18 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 90 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ 2026 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි වාරික ගෙවන්නකු විසින් වාරික වශයෙන් ගෙවිය යුතු බදු මුදල ගණනය කිරීමේ ක්‍රමවේදය පිළිබඳව විධිවිධාන සැලැස්වීම වේ.

***19 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 91 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ බදු ඇස්තමේන්තුවක් ගොනු කිරීමේ අවශ්‍යතාවය 2026 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව වූ බදු අය කළ හැකි කාලසීමාවලට සීමා කිරීම වේ.

***20 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 92 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 19 වන වගන්තියේ සඳහන් සංශෝධනයට ආනුෂංගික වේ.

***21 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 94 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ -

(අ) බදු වාර්තාවක් ගොනු කිරීමේ අවශ්‍යතාවයෙන් නිශ්චිතව සඳහන් පුද්ගලයන් නිදහස් කිරීම වේ; සහ

(ආ) 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තකුට බදු වාර්තාවක් ගොනු කිරීම සඳහා නියම කිරීම වේ.

***22 වන වගන්තිය***: මේ වගන්තිය මගින් පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 95 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***23 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 96අ වන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ සේවානියුක්තයකු විසින් ලබා ගන්නා හිඟ වැටුප් මත බදු බැර ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් විධිධාන සැලැස්වීම වේ.

***24 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 100 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ තොරතුරු අනාවරණය කිරීම සම්බන්ධයෙන් ඒ වගන්තියේ විෂය පථය පුළුල් කිරීම වේ.

***25 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 102 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියාපදිංචි වීම සඳහා සමාගම් සම්බන්ධයෙන් කාලසීමාවක් නිශ්චිතව දැක්වීම වේ.

***26 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 103 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ තැනැත්තකුට TIN සහතිකය ඉදිරිපත් කිරීමට නියම කරනු ලැබිය හැකි අවස්ථා නිශ්චිතව දැක්වීම වේ.

***27 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥාප්තියේ 113 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනිකව බදු වාර්තා ගොනු කිරීමට ජ්‍යෙෂ්ඨ පුරවැසින්ට හැකියාව ලබාදීම වේ.

***28 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 122 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ නිශ්චිතව දක්වන ලද කාලසීමාවන් තුළ කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් නොකළ යම් ලේඛනයක් හෝ තොරතුරක් යම් අධිකරණ හෝ බදු අභියාචන කොමිෂන් සභාවේ කටයුත්තක දී ඉදිරිපත් කිරීමෙන් වැළැක්වීම වේ.

***29 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 135 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ බදු වාර්තාවක් මත යම් සංශෝධිත තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් සිදු නොකරනු ලැබිය යුතු අවස්ථාවන් පිළිබඳ විධිවිධාන සැලැස්වීම වේ.

***30 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 150 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සහ ගිවිසුම් යටතේ ගෙවීම් ලබන තැනැත්තන් සම්බන්ධයෙන් බදු ආපසු ගෙවනු ලැබීමට විධිවිධාන සැලැස්වීම වේ.

***31 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ බදු ගෙවීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් තැනැත්තන්ට විරුද්ධව නඩු පැවරීමට අදාළ කාර්යපටිපාටිය සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***32 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 175අ වන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ සිතාසි සහ දැන්වීම් භාර දීම සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම වේ.

***33 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 178අ වන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන කාර්යපටිපාටිවලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් සහ අසත්‍ය තොරතුරු සැපයීම සම්බන්ධයෙන් රඳවා ගැනීමේ අනුයෝජිතයන් සහ පුද්ගලයන් දණ්ඩනයකට යටත් කිරීම වේ.

***34 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට XVIIඅ වන අලුත් පරිච්ඡේදය ඇතුළත් කරනු ලබන අතර, ඒ පරිච්ඡේදයේ නීතිය බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ වන නියමයන්ට අනුකූල වීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් නඩු පැවරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***35 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 193 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ වැරදි සමථයකට පත් කිරීම සඳහා ඇතැම් කොන්දේසි පැනවීම සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම වේ.

***36 වන වගන්තිය***: මේ වගන්තිය මගින් පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 195 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***37 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 202 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ වගන්තිය අදාළ වීමේ පැහැදිලිභාවය වැඩි කිරීම වේ.

***38 වන වගන්තිය***: මේ වගන්තිය මගින් පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 203 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***39 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ උපලේඛනයේ නීතිය බලපෑම වනුයේ මේ පනත ක්‍රියාත්මක වන දින සිට බලාත්මක වන පරිදි පුද්ගලයන්, හවුල් ව්‍යාපාර, භාර, සමාගම්, ඒකක භාර සහ රාජ්‍ය නොවන සංවිධාන සඳහා බදු අනුප්‍රමාණයන් නිශ්චිතව දැක්වීම වේ.

***40 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ උපලේඛනයේ නීතිය බලපෑම වනුයේ ඇතැම් ආයෝජන සඳහා දිරි දීමනා ලබා දීම සඳහා වන අවශ්‍යතාවයන් නිශ්චිතව දැක්වීම වේ.

***41 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ උපලේඛනයේ නීතිය බලපෑම වනුයේ ඇතැම් ව්‍යාපෘති සහ ව්‍යාපාර සඳහා ප්‍රදානය කරන ලද නිදහස් කිරීම් සඳහා තවදුරටත් පැහැදිලි කිරීම් සැපයීම වේ.

***42 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ හතරවන උපලේඛනයේ සිංහල පාඨයේ ඇති දෝෂයක් නිවැරදි කිරීම සඳහා ඒ උපලේඛනය සංශෝධනය කරනු ලැබේ.

***43 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ උපලේඛනයේ නීතිය බලපෑම වනුයේ ඇතැම් කොන්දේසිවලට යටත්ව, පුණ්‍ය ආයතනවලට කරන ලද පරිත්‍යාගයන් සඳහා සුදුසුකම් ලබන ගෙවීම් අඩු කිරීම් සඳහා අවසර ලබා දීම වේ.

***44 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ හයවන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ උපලේඛනයේ නීතිය බලපෑම වනුයේ ඇතැම් තාවකාලික සහන අදාළවීම සම්බන්ධයෙන් කාලසීමාවක් නිශ්චිතව දැක්වීම වේ.

***45 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ ඇතැම් වගන්තිවල විධිවිධාන යටතේ, සහ 2022 අංක 14 දරන අධිභාර බද්ද පනත යටතේ සහ 2018 අංක 35 දරන මුදල් පනත යටතේ පනවන ලද පොලිය කපා හැරීම සඳහා විධිවිධාන සලස්වනු ලැබේ.

එල්.ඩී.-ඕ. 14/2025

## 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

**1.** (1) මේ පනත 2026 අංක දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් වගන්තිවල විධිවිධාන හැර මේ පනතේ විධිවිධාන, පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත් වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) පහත දැක්වෙන *වගුවේ I වන තීරයේ* නිශ්චිතව දක්වා ඇති මේ පනතේ විධිවිධාන මගින් සංශෝධනය කරනු ලබන්නා වූ, ඒ *වගුවේ II වන තීරයේ* නිශ්චිතව දක්වා ඇති (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන, ඒ *වගුවේ III වන තීරයේ* නිශ්චිතව දක්වා ඇති අදාළ දිනයන්හි දී, අවස්ථාවෝචිත පරිදි, ක්‍රියාත්මක විය යුතු ය; නැතහොත් ක්‍රියාත්මක කරනු ලැබ ඇති ලෙසට සලකනු ලැබිය යුතු ය.

*වගුව*

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* |
|---|---|---|
| මේ පනතේ වගන්තිය | ප්‍රධාන ප්‍රඥප්තියේ සංශෝධනය කරනු ලබන වගන්තිය | ක්‍රියාත්මක වන දිනය |
| 2 | 8 | 2024.04.01 |
| 3 | 10(2අ) | 2023.05.08 |
| 4 | 18(5) | 2025.04.01 |
| 6 | 52 | 2025.04.01 |
| 7 | 52අ | 2025.04.01 |
| 8 | 59(1අ) සහ (2) | 2025.04.01 |

PL 15705 - 342 (2026/03)

| | | |
|---|---|---|
| 9 | 67(1), (1අ), (2) සහ (2අ) | 2025.04.01 |
| 10 | 68(3) | 2025.04.01 |
| 11 | 69(1)(ඇ), (1අ) සහ (2අ) | 2025.04.01 |
| 12 | 72(3) | 2018.04.01 |
| 13 | 79(1), (2) සහ (3) | 2025.04.01 |
| 14(1)(ආ) | 84(2)(ආ) | 2026.04.01 |
| 14(2)(ඇ) | 84(3)(ඊ) | 2025.04.01 |
| 18 | 90(3) සහ (6) | 2026.04.01 |
| 19 | 91(1), (3), (4), (5) සහ (6) | 2026.04.01 |
| 20 | 92(1) | 2026.04.01 |
| 21 | 94(1) | 2025.04.01 |
| 23 | 96අ | 2024.01.01 |
| 38 | 203(6) | 2025.03.31 |
| 39 | පළමුවන උපලේඛනයේ 4 වන ඡේදයේ (2ආ) උපඡේදයේ (ආ) අයිතමය | 2022.04.01 |
| 40 | දෙවන උපලේඛනයේ (1අ) සහ (2අ) උපඡේද | 2026.04.01 |
| 41 | තුන්වන උපලේඛනයේ (අ) (iv) වන ඡේදය | 2018.04.01 |
| 42 | තුන්වන උපලේඛනයේ (එ)(ii), (ඍ) සහ (තතත) ඡේද | 2025.04.01 |
| 43 | පස්වන උපලේඛනය | 2025.04.01 |
| 44 | හයවන උපලේඛනය | 2024.04.01 |

**ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම**

**2**. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපවගන්තියේ "කවර හෝ මූලාශ්‍රයකින්" යන වචන වෙනුවට, "වෙනත් මූලාශ්‍රවලින්;" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ "ගෙවීම්; සහ" යන වචන වෙනුවට, "ගෙවීම්;" යන වචනය ආදේශ කිරීමෙන්;

(3) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "මුදල් ප්‍රමාණ." යන වචන වෙනුවට "මුදල් ප්‍රමාණ; සහ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(4) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(ඇ) මෝටර් වාහන උපලබ්ධි කිරීමෙන් ලැබෙන ලැබීම්.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම**

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (viii) වන අනුඡේදයේ "සංචිතයකට හෝ වෙනත් ස්ථානයකට" යන වචන වෙනුවට, "සංචිතයකට හෝ වෙන් කිරීමේ ගිණුමකට" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (2අ) වන උපවගන්තියේ-

(අ) (අ) ඡේදයේ "බැංකු අණකරයක් මගින් හෝ" යන වචන වෙනුවට, "බැංකු අණකරයක් මගින් හෝ වෙනත් තැනැත්තකුගේ බැංකු ගිණුමට මුදල් තැන්පත් කිරීම මගින් හෝ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) (ආ) ඡේදයේ-

(i) (i) වන අනුඡේදයේ "ශ්‍රී ලංකා රජය" යන වචන වෙනුවට, "ශ්‍රී ලංකා රජයට හෝ යම් රජයේ ආයතනයකට කරන ලද යම් ගෙවීමක් හෝ ශ්‍රී ලංකා රජය" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ii) (ii) වන අනුඡේදයේ "බැංකුවක්" යන වචනය වෙනුවට, "බැංකුවකට හෝ මූල්‍ය ආයතනයකට කරන ලද යම් ගෙවීමක් හෝ බැංකුවක්" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම

**4**. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(5) මේ වගන්තියේ කාර්යය සඳහා-

(අ) "සංචිත" යන්නට, සෘණාත්මක රඳවා ගනු ලැබූ ලාභ, සමුච්චිත අලාභ හෝ සංචිතවල හිඟ ඇතුළත් වන නමුත් යම් වත්කමක් ප්‍රත්‍යාගණනය කිරීමෙන් පැනනගින සංචිත ඇතුළත් නොවේ; සහ

(ආ) අස්ථිත්වයක සෘණාත්මක රඳවා ගනු ලැබූ ලාභ, සමුච්චිත අලාභ හෝ සංචිතවල හිඟ පවතින අවස්ථාවක "අස්ථිත්වයේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයේ සහ සංචිතවල මුළු එකතුව", ඒ සෘණාත්මක රඳවා ගනු ලැබූ ලාභ, සමුච්චිත අලාභ සහ සංචිතවල හිඟ සැලකිල්ලට ගනිමින් ගණනය කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(3අ) තැනැත්තකු විසින් ශ්‍රී ලංකා ආණ්ඩුවට හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද හෝ පිහිටුවනු ලැබ ඇති ලෙසට

සලකනු ලබන යම් විශ්වවිද්‍යාලයකට ත්‍යාගයක් හෝ පරිත්‍යාගයක් ලෙස වත්කමක හිමිකාරිත්වය පැවරීම මගින් වත්කමක් උපලබ්ධි කරනු ලබන අවස්ථාවක දී, එම තැනැත්තා විසින්, උපලබ්ධි කිරීමට පෙරාතුවම වූ වත්කමෙහි ශුද්ධ පිරිවැයට සමාන මුදලක් උපලබ්ධි කිරීමේ දී උපයනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම

**6**. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

“(4) අදාළ තක්සේරු වර්ෂයේ තක්සේරු කළ හැකි මුළු ආදායම, පුද්ගලයකුගේ හෝ අස්ථිත්වයක බදු අය කළ හැකි ආදායම ගණනය කිරීමේ දී අඩු කරනු ලැබිය යුතු සුදුසුකම් ලබන ගෙවීම් ප්‍රමාණය ඉක්මවා නොයාම හේතුවෙන්, 2025 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, මේ වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාරව, පස්වන උපලේඛනයේ 1 වන ඡේදයේ (ආ) උපඡේදයේ (i) වන සහ (v) වන අයිතමවල සඳහන් යම් සුදුසුකම් ලබන ගෙවීමක් අඩු කිරීමට නොහැකි වන අවස්ථාවක දී, අදාළ තක්සේරු වර්ෂයේ දී අඩු කිරීමට නොහැකි ඒ සුදුසුකම් ලබන ගෙවීම් ප්‍රමාණය ඉදිරියට ගෙන යා යුතු අතර, එය අදාළ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂයේ ඒ පුද්ගලයාගේ හෝ අස්ථිත්වයේ තක්සේරු කළ හැකි ආදායමෙන් හෝ ඉන් පසුව එළඹෙන යම් අනුයාත වර්ෂයක තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කරනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියට 52අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 52අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

"ජීවිත රක්ෂණ ඔප්පුවලින් ලැබෙන මුදල්

**52අ.** (1) මේ පනතේ පටහැනිව කුමක් සඳහන් වී තිබුණ ද, 4 වන වගන්තිය යටතේ තක්සේරු වර්ෂයක් සඳහා පුද්ගලයකුගේ තක්සේරු කළ හැකි ආදායම ගණනය කිරීමේ දී-

(අ) රක්ෂිත තැනැත්තාගේ මරණය සිදු වීමේ දී;

(ආ) ජීවිත රක්ෂණ ඔප්පුව කල්පිරීමේ දී; හෝ

(ඇ) ජීවිත රක්ෂණ ඔප්පුව පවාරන අගයක් අත්කර ගැනීමේ දී,

ජීවිත රක්ෂණ ඔප්පුහිමියා ලෙස හෝ ඒ ඔප්පුවේ අර්ථලාභියකු ලෙස, ජීවිත රක්ෂණ ඔප්පුවක් යටතේ පුද්ගලයකුට ලැබෙන හෝ පුද්ගලයකු විසින් උපයනු ලබන යම් මුදල් ප්‍රමාණයක් ඇතුළත් කරනු නොලැබිය යුතු ය.

(2) ජීවිත රක්ෂණ ඔප්පුවක් සම්බන්ධයෙන් හෝ ජීවිත රක්ෂණ ඔප්පුවක් යටතේ කරනු ලබන පහත සඳහන් ගෙවීම්වලට (1) වන උපවගන්තිය අදාළ නොවිය යුතු ය:-

(අ) සේවානියුක්ති ආදායම හෝ ව්‍යාපාරික ආදායම සංයුක්ත වන්නා වූ, ජීවිත රක්ෂණ ඔප්පුවක් යටතේ ලැබෙන යම් මුදල් ප්‍රමාණයක්; හෝ

(ආ) යම් වාර්ෂික ගෙවීමක්, යම් විශ්‍රාම වැටුප් ගෙවීමක්, විශ්‍රාම ගෙවීමක් හෝ විශ්‍රාම පාරිතෝෂික ගෙවීමක් හෝ, රක්ෂිත තැනැත්තාගේ මරණය සිදුවීමේ දී හෝ ජීවිත රක්ෂණ ඔප්පුවක් කල්පිරීමේ දී

කරනු ලබන ගෙවීමක් නොවන, ජීවිත රක්ෂණ ඔප්පුවක් යටතේ කරනු ලබන යම් ගෙවීමක්.

(3) මේ වගන්තියේ සඳහන් කිසිවකින් 35 වන වගන්තිය අදාළ වීම සීමා කිරීමක් සිදු නොවිය යුතු ය; නැතහොත් අදාළ වීම කෙරෙහි බලපෑමක් ඇති නොවිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්යය සඳහා, “ජීවිත රක්ෂණ ඔප්පුව” යන්නෙන්, පුද්ගලයකුගේ මරණය සිදු වීමේ දී මුදල් ගෙවීම සඳහා විධිවිධාන සලස්වන, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ බලපත්‍රලාභී රක්ෂණකරුවකු විසින් නිකුත් කරන ලද රක්ෂණ ගිවිසුමක් අදහස් වේ.”.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

“(1අ) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, 2025 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ සිට බලාත්මක වන පරිදි, මාර්තු මස තිස් එක් වන දිනයෙන් අවසන් වන එක් එක් තක්සේරු වර්ෂය අවසාන වීමෙන් පසු මාස පහක් ඇතුළත, ආදායම, බද්දෙන් නිදහස් මුදල් ප්‍රමාණ, රඳවා ගැනීමේ බද්ද සහ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කර ඇති වෙනත් යම් තොරතුරු ඇතුළත් සහතිකයක් සෑම ඒකක දරන්නකු වෙත ම ලබාදීමට අපොහොසත් වන යම් ඒකක භාරයක් හෝ අන්‍යෝන්‍ය අරමුදලක් ශ්‍රී ලංකාවේ වාසික සමාගමක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ශ්‍රී ලංකාවේ වාසික සමාගම්වලට අදාළ වන මේ පනතේ විධිවිධාන ඊට අදාළ විය යුතු ය” ; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ “(1) වන උපවගන්තියේ” යන වචන සහ ඉලක්කම වෙනුවට, “(1) වන උපවගන්තියේ හෝ (1අ) වන උපවගන්තියේ” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය සංශෝධනය කිරීම

**9**. ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ “එම ව්‍යාපාරයෙන් ලැබෙන,” යන වචන වෙනුවට, “2025 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව වූ යම් තක්සේරු වර්ෂයක් සඳහා එම ව්‍යාපාරයෙන් ලැබෙන,” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

“(1අ) අන්‍යෝන්‍ය හෝ හිමිකාරිත්ව ජීවිත රක්ෂණ ව්‍යාපාරයක නිරතව සිටින තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, 2025 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා එම ව්‍යාපාරයෙන් ලැබෙන, බද්ද ගෙවනු ලැබිය යුතු ලැබීම් සහ ලාභ -

(අ) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ විධිවිධාන ඇතුළත කටයුතු කරන ජීව ගණකයකු විසින් සහතික කරනු ලබන පරිදි වූ ජීවිත රක්ෂණ ඔප්පු දරන්නන්ගේ අරමුදලින් කොටස්කරුවන් වෙත බෙදා හරිනු ලබන හෝ සපයනු ලබන අතිරික්තයෙහි හෝ යම් මුදල් ප්‍රමාණයක; සහ

(ආ) කොටස්කරුවන්ගේ අරමුදලේ ආයෝජන ආදායමින් එම ආදායම උත්පාදනය කිරීමේ දී දරන ලද වියදම් කිසිවක් අඩු කළ පසු ඉතිරි වන මුදලෙහි,

එකතුව ගනිමින්, ඒ ව්‍යාපාරයෙන් ලැබෙන ආදායම ගණනය කිරීමේ දී 19 වන වගන්තිය යටතේ ඉල්ලා සිටිය හැකි අඩුකිරීම්වලට යටත්ව, නිශ්චය කරනු ලැබිය යුතු ය.";

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "යම් වර්ෂයක් තුළ දී" යන වචන වෙනුවට, "2025 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව වූ යම් තක්සේරු වර්ෂයක් තුළ දී" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(4) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(2අ) (1අ) වන උපවගන්තියේ කාර්යය සඳහා, 2025 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව එළඹෙන යම් තක්සේරු වර්ෂයක් සඳහා ජීවිත රක්ෂණ ව්‍යාපාරයෙහි නිරත තැනැත්තකු විසින් ජීවිත රක්ෂණ ඔප්පු දරන්නකුට හෝ ඔහු වෙනුවෙන් ලාභාංශ වශයෙන්, ප්‍රසාද දීමනා වශයෙන් හෝ ඊට සමාන වෙනත් ආකාරයකින් බෙදා හරිනු ලබන අතිරික්තය ඇතුළුව ගෙවන ලද මුදල් ප්‍රමාණ ජීවිත රක්ෂණ ව්‍යාපාරයේ නිරත ඒ තැනැත්තාට ලැබෙන ලැබීම් සහ ලාභ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව බද්දට යටත් විය යුතු ය."; සහ

(5) ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-

"(5) රක්ෂණ ව්‍යාපාරයට අදාළ වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රතිශෝධනය කරනු ලබන අවස්ථාවක, කිසිදු අයිතමයක් තක්සේරු කිරීමක දී මග නොහැරෙන බවට හෝ එක් වරකට වඩා වැඩි වාරගණනක්

ගණනය කරනු නොලබන බවට සහතික වීම සඳහා, කොමසාරිස් ජනරාල්වරයා විසින් මේ පනතේ කාර්යය සඳහා, ඒ ප්‍රතිශෝධනවලට පසුව එළඹෙන අදාළ තක්සේරු වර්ෂ සඳහා අවශ්‍ය වන ගැලපීම් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය.''.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ ''යම් තක්සේරු වර්ෂයක් තුළ දී'' යන වචන වෙනුවට, ''2025 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව වූ යම් තක්සේරු වර්ෂයක් තුළ දී'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-

''(4) මේ පනතේ පස්වන උපලේඛනයේ 1 වන ඡේදයේ (අ) උපඡේදයේ සඳහන් ආයතනයක් සම්බන්ධයෙන් වන විට, 2025 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ සිට බලාත්මක වන පරිදි, ඒ උපඡේදයේ නිශ්චිතව දක්වා ඇති සේවා සැපයීමේ පිරිවැය ඒ ආයතනය විසින් දරන ලද බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන අවස්ථාවක දී, කොමසාරිස් ජනරාල්වරයා විසින් එම තක්සේරු වර්ෂය සඳහා ඒ ආයතනය විසින් එහි බදු අය කළ හැකි ආදායම මත ගෙවිය යුතු බද්දට සමාන බදු බැරක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.''.

**11**. ප්‍රධාන ප්‍රඥප්තියේ 69 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 69 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ “නියුක්තව සිටින කාලසීමාව තුළ,” යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

“නියුක්තව සිටින කාලසීමාව තුළ:

එසේ වුවද, ඒ පුද්ගලයා ශ්‍රී ලංකාව හැර යම් රටක පුරවැසියකු හෝ යටත්වැසියකු වේ නම්, ඒ පුද්ගලයා එසේ ශ්‍රී ලංකාවේ වාසිකයකු ලෙස සලකනු ලැබීම හේතුවෙන් එවැනි නෞකාවක සේවානියුක්තියෙන් ලැබෙන ආදායම සඳහා හැර ඔහුගේ වෙනත් යම් ආදායමක් සම්බන්ධයෙන් වාසිකයකු ලෙස ඒ පුද්ගලයා ආදායම් බද්දට යටත් නොවන්නේ ය:

එසේම තවදුරටත්, මේ ඡේදය යටතේ ආදායම් බදු කාර්යය සඳහා පමණක් ශ්‍රී ලංකාවේ වාසිකයකු වශයෙන් සලකනු ලබන යම් පුද්ගලයකු, ඔහු එසේ සේවයේ නියුක්තව සිටින කාලසීමාව තුළ දී ශ්‍රී ලංකාවේ වාසිකයකු ලෙස සලකනු ලැබිය යුතු ය.”;සහ

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන්:-

“(1අ) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුවද, යම් පුද්ගලයකු ආගමන හා විගමන පාලකවරයා විසින් නිකුත් කරනු ලබන ගෝල්ඩන් පැරඩයිස් නේවාසික වීසා බලපත්‍රයක් දරන්නේ නම්, ඒ පුද්ගලයා තක්සේරු වර්ෂයක් සඳහා ශ්‍රී ලංකාවේ වාසිකයකු නොවන්නේ ය.

(2අ) සැක දුරු කිරීමේ කාර්යය සඳහා, පුද්ගලයකු ඒ පුද්ගලයාගේ ආසන්නතම ශ්‍රී ලාංකික සේවායෝජකයා සමඟ

සම්බන්ධතාවයක් නොමැත්තා වූ යම් සේවායෝජකයකු සමඟ අවුරුදු එකකට වඩා අඩු නොවන කාලයක් සඳහා වන ගිවිසුමක් යටතේ වූ සේවානියුක්තියක් සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව යන්නේ නම්, ඒ පුද්ගලයා ශ්‍රී ලංකාවෙන් බැහැරව යන තක්සේරු වර්ෂයේ පළමුවන දිනයෙන් ආරම්භව ඒ ගිවිසුම කල් ඉකුත්වීමේ දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා ඒ පුද්ගලයා ශ්‍රී ලංකාවේ වාසිකයකු ලෙස සලකනු නොලබන බවට මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.”.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තිය සංශෝධනය කිරීම

“(3) (2) වන උපවගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුවද, ශ්‍රී ලංකාවේ මූලාශ්‍රයක් නොමැති යම් ගෙවීමක්, ඒ ගෙවීම අදාළ තක්සේරු වර්ෂය තුළ දී ශ්‍රී ලංකාවෙන් භාණ්ඩ හෝ සේවා අපනයනය කිරීම සම්බන්ධයෙන් දරන ලද ප්‍රමාණයට, ආදායම ගණනය කිරීමේ දී සෘජුව ම අඩු කරනු ලැබිය යුතු ය.”.

**13**. ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන්;

(2) ඒ වගන්තියේ නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියේ “වියදමක් ලෙස දරන ලද” යන වචන වෙනුවට, “වියදමක් ලෙස 2025 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව වූ යම් තක්සේරු වර්ෂයක් තුළ දරන ලද” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන්:-

"(2) ශ්‍රී ලංකාවේ ස්ථිර ආයතනයක් හරහා ව්‍යාපාරයක් කරගෙන යනු ලබන යම් නිර්වාසික තැනැත්තකු විසින් 2025 අප්‍රේල් මස 1 වන දින සහ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් තුළ දී ප්‍රධාන කාර්යාලයේ වියදමක ස්වභාවයේ වූ යම් වියදමක් දරනු ලබන අවස්ථාවක-

(අ) ඒ වියදමට සමාන මුදල් ප්‍රමාණය; හෝ

(ආ) ඒ ව්‍යාපාරයෙන් ලැබුණු ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායමෙන් සියයට දහයකට සමාන මුදල් ප්‍රමාණය,

යන දෙකෙන් අඩු මුදලට සමාන මුදලක් ඒ තක්සේරු වර්ෂය සඳහා අඩු කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා, නිර්වාසික තැනැත්තකු සම්බන්ධයෙන් සහ යම් තක්සේරු වර්ෂයක් සඳහා "ප්‍රධාන කාර්යාලයේ වියදම්" යන්නෙන්-

(අ) ශ්‍රී ලංකාවෙන් බැහැර යම් සමාගමක කාර්යාලයක සේවයේ නියුක්ත කරන ලද හෝ එහි කටයුතු කළමනාකරණය කරනු ලබන සෑම සේවානියුක්තයකු ම සහ වෙනත් සෑම තැනැත්තකු ම ඔවුන්ගේ සේවානියුක්තියෙන් ලැබූ මුළු ආදායමෙහි සහ ඔවුන් විසින් ගමන් බිමන් සඳහා දරන ලද මුළු පිරිවැයෙහි එකතුවෙන් සමන්විත වන වියදම්; සහ

(ආ) ශ්‍රී ලංකාවෙන් බැහැර යම් පරිශ්‍රයක් සම්බන්ධයෙන් දරන ලද වියදම්,

ඇතුළුව ඒ නිර්වාසික තැනැත්තා විසින් හෝ ඒ නිර්වාසික තැනැත්තා වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් බැහැරව දරන ලද විධායක සහ සාමාන්‍ය පරිපාලන වියදම් අදහස් වේ.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තිය සංශෝධනය කිරීම

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ-

(අ) ඒ උපවගන්තිය, ඒ උපවගන්තියේ (අ) ඡේදය ලෙස නැවත අක්ෂර යෙදීමෙන්; සහ

(ආ) ඒ උපවගන්තියේ නැවත අක්ෂර යොදන ලද (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

“(ආ) 2026 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ සිට බලාත්මක වන පරිදි ඒ අධිකාරිය විසින්, එක් එක් ලිත් මාසය අවසන් වීමෙන් පසු දින තිහක කාලසීමාවක් ඇතුළත, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි විස්තර ඇතුළත් මාසික බදු වාර්තාවක්, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ආකාරයකින් ගොනු කළ යුතු ය.”; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ-

(අ) “මේ වගන්තිය-” යන වචන වෙනුවට, “මේ වගන්තිය සහ 84අ වන වගන්තිය-” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ (ඉ) ඡේදයේ "වෙන් කිරීම." යන වචන වෙනුවට, "වෙන් කිරීම;" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) ඒ උපවගන්තියේ (ඉ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(ඊ) ශ්‍රී ලංකාවේ වාසික පුද්ගලයකුට තක්සේරු වර්ෂය සඳහා බදු අය කළ හැකි ආදායමක් නොමැති අවස්ථාවක දී සහ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන ආකාරයට මූල්‍ය ආයතනයක් වෙත ස්වයං ප්‍රකාශයක් සපයනු ලබන අවස්ථාවක දී, 2025 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ තැනැත්තා විසින් ඒ මූල්‍ය ආයතනයේ පවත්වාගෙන යනු ලබන යම් තැන්පතුවක් මත ඒ මූල්‍ය ආයතනය විසින් ඒ පුද්ගලයාට ගෙවන ලද පොලියක් හෝ වට්ටමක්,".

ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තිය සංශෝධනය කිරීම

**15**. ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තියේ (1ඇ) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "ශාස්ත්‍රඥයකු හෝ නියෝග මගින්" යන වචන වෙනුවට, "ශාස්ත්‍රඥයකු, විගණකවරයකු, නිරූපණ ශිල්පියකු, පෞද්ගලික පුහුණුකරුවකු, ක්‍රීඩා පුහුණුකරුවකු, තක්සේරුකරුවකු, කලාකරුවකු, නළුවකු, නර්තන ශිල්පියකු, ගායකයකු, සංගීතඥයකු, උත්සව සංවිධායකවරයකු, ඡායාරූප ශිල්පියකු, වීඩියෝ ශිල්පියකු, චිකිත්සකවරයකු, මනෝ චිකිත්සකවරයකු, රූපලාවන්‍ය ශිල්පියකු, අරක්කැමියකු, විදුලි කාර්මික ශිල්පියකු, දන්ත වෛද්‍යවරයකු, පශු වෛද්‍යවරයකු, සමාජ මාධ්‍ය පිළිබඳ විශේෂඥයකු, සන්නාම තානාපතිවරයකු, ක්‍රීඩකයකු, තොරතුරු තාක්ෂණය පිළිබඳ විශේෂඥයකු, ප්‍රචාරණ නියෝජිතයකු, උපදේශකයකු, භාෂා පරිවර්තකයකු, ලේඛකයකු, ණය එකතු කරන්නකු හෝ නියෝග මගින්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තිය සංශෝධනය කිරීම

**16**. ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තියේ (8) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(9) (2) වන සහ (8) වන උපවගන්ති යටතේ වූ ප්‍රකාශ ගොනු කිරීම සඳහා අවශ්‍ය වන කාර්යපටිපාටි, ආකෘති සහ ආකෘති පත්‍ර කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය. සෑම රඳවා ගැනීමේ අනුයෝජිතයකු විසින් ම එම කාර්යපටිපාටිවලට, ආකෘතිවලට සහ ආකෘති පත්‍රවලට අදාළ නියමයන්ට අනුකූලව ක්‍රියා කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තිය සංශෝධනය කිරීම

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තියේ (5) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(6) රඳවා ගැනීමේ අනුයෝජිතයකු විසින් යම් ගාස්තුවක් හෝ ගෙවීමක් නොමැතිව රඳවා ගනු ලැබීමට යටත්වන්නකු වෙත රඳවා ගැනීමේ සහතිකයක් භාර දිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 90 වන වගන්තිය සංශෝධනය කිරීම

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 90 වන වගන්තියේ (3) වන උපවගන්තියේ දක්වා ඇති සූත්‍රය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ සූත්‍රයේ "*A*" අයිතමයේ "තක්සේරු වර්ෂය සඳහා වාරික ගෙවන්නා විසින් 91 වන හෝ 92 වන වගන්තිය යටතේ ගෙවනු ලැබිය යුතු වර්තමාන ඇස්තමේන්තුගත බද්ද වේ;" යන වචන සහ ඉලක්කම් වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(අ) 2026 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව වූ යම් තක්සේරු වර්ෂයක් සඳහා, වාරික ගෙවන්නා විසින් 91 වන හෝ 92 වන වගන්තිය යටතේ ගෙවනු ලැබිය යුතු ඇස්තමේන්තුගත බද්ද වේ; සහ

(ආ) 2026 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, තක්සේරු වර්ෂයට පෙරාතුව ම වූ තක්සේරු වර්ෂයේ දී, 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ බදු අය කළ හැකි ආදායමට අදාළව වාරික ගෙවන්නා විසින් ගෙවනු ලැබිය යුතු බදු ප්‍රමාණය වේ:

එසේ වුවද, වාරික ගෙවන්නාට පෙරාතුව ම වූ තක්සේරු වර්ෂය සඳහා බදු අය කළ හැකි ආදායම් කිසිවක් නොමැති අවස්ථාවක දී හෝ වර්තමාන තක්සේරු වර්ෂය තුළ දී පෙරාතුව ම වූ තක්සේරු වර්ෂයේ බදු අය කළ හැකි ආදායමට වඩා අඩු බදු අය කළ හැකි ආදායමක් ඉපයීමට අපේක්ෂා කරන අවස්ථාවක දී, වර්තමාන තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ඇස්තමේන්තුගත බද්ද '*A*' ලෙස සලකනු ලැබිය යුතු ය. මේ කාර්යය සඳහා, වර්තමාන තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ඇස්තමේන්තුගත බද්ද කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන කාර්යපටිපාටිය අනුව සහ ඔහු විසින් නිශ්චිතව දක්වනු ලබන පදනම මත ගණනය කරනු ලැබිය යුතු ය;'' ;

(2) ඒ සූත්‍රයේ '*C* ' අයිතමයේ (ආ) ඡේදයේ ''වර්ෂය සඳහා වූ'' යන වචන වෙනුවට ''2026 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයට පෙරාතුව වූ යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් සහ ''යම් බදු මුදලක; සහ'' යන වචන වෙනුවට, ''යම් බදු මුදලක;'' යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ සූත්‍රයේ '*C* ' අයිතමයේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

(ආඅ) ඒ තැනැත්තාට ලැබුණා වූ ද 2026 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ ඒ තැනැත්තාගේ ආදායම ගණනය කිරීමේ දී ඇතුළත් කරනු ලබන්නා වූ ද ගෙවීම්වලින් II වන කාණ්ඩය යටතේ අදාළ තක්සේරු වර්ෂය තුළ දී රඳවා ගනු ලැබූ හෝ රඳවා ගත යුතු යම් බදු මුදලක; සහ”;

(4) ඒ සූත්‍රයේ ‘*C* ’ අයිතමයේ (ඇ) ඡේදයේ අතුරු විධානයේ “එසේ වුවද, වාරික ගෙවන්නකු” යන වචන වෙනුවට, “එසේ වුවද, 2026 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයට පෙරාතුව වූ තක්සේරු වර්ෂයක් සඳහා වාරික ගෙවන්නකු” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(5) ඒ වගන්තියේ (5) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-

“(6) 2026 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් සඳහා වාරික ගෙවන්නකු විසින් ගෙවිය යුතු බදු මුදල නිශ්චය කිරීමේ දී, ඒ වාරික ගෙවන්නා විසින් 80 වන වගන්තිය යටතේ ඉල්ලා සිටිය හැකි විදේශීය බදු බැර සැලකිල්ලට ගනු ලැබිය හැකි ය. එසේ වුවද, එසේ කිරීමේ දී වාරික ගෙවන්නා විසින් ඒ විදේශීය ආදායම් බද්ද ගෙවා ඇත්නම් පමණක් හෝ ඒ විදේශීය ආදායම් බද්ද ඒ තක්සේරු වර්ෂයට අනුරූප කාලසීමාව තුළ ගෙවනු ලබන බවට වාරික ගෙවන්නා විසින් සාධාරණ ලෙස ඇස්තමේන්තු කරන්නේ නම් පමණක් ඒ වාරික ගෙවන්නා විසින් විදේශීය ආදායම් බද්ද සැලකිල්ලට ගනු ලැබිය හැකි ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 91 වන වගන්තිය සංශෝධනය කිරීම

**19**. ප්‍රධාන ප්‍රඥප්තියේ 91 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ ''තක්සේරු වර්ෂයක් සඳහා'' යන වචන වෙනුවට, ''2026 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ ''මේ වගන්තියේ (6) වන'' යන වචන සහ ඉලක්කම වෙනුවට, ''2026 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයට පෙරාතුව වූ යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ වගන්තියේ (6) වන'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(3) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ ''තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු බද්ද ඇස්තමේන්තු කිරීමේ දී'' යන වචන වෙනුවට, ''2026 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් සඳහා ගෙවිය යුතු බද්ද ඇස්තමේන්තු කිරීමේ දී'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(4) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ ''(1) වන උපවගන්තිය යටතේ'' යන වචන සහ ඉලක්කම වෙනුවට, ''2026 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයට පෙරාතුව, (1) වන උපවගන්තිය යටතේ'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(5) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ ''(5) වන උපවගන්තිය යටතේ තැනැත්තකු විසින් ගොනු කරනු ලබන'' යන වචන සහ ඉලක්කම වෙනුවට, ''2026 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයට පෙරාතුව (5) වන උපවගන්තිය යටතේ තැනැත්තකු විසින් ගොනු කරනු ලබන'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 92 වන වගන්තිය සංශෝධනය කිරීම

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 92 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "91 වන වගන්තිය යටතේ ඇස්තමේන්තුවක්" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "2026 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයට පෙරාතුව 91 වන වගන්තිය යටතේ ඇස්තමේන්තුවක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 94 වන වගන්තිය සංශෝධනය කිරීම

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 94 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ-

(අ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ "යම් පුද්ගලයකු," යන වචන වෙනුවට, "යම් පුද්ගලයකු; හෝ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(ඈ) තක්සේරු වර්ෂය සඳහා පොලී ආදායම රුපියල් පන්දහස නොඉක්මවන, මේ උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් පුද්ගලයකු,"; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(2අ) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුවද, 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ විධිවිධාන යටතේ අනුමත කර ඇති ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තකු විසින් කොමසාරිස් ජනරාල්වරයා විසින්

නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන් සහ ආකාරයෙන් බදු වාර්තාවක් ගොනු කළ යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 95 වන වගන්තිය සංශෝධනය කිරීම

**22**. ප්‍රධාන ප්‍රඥප්තියේ 95 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ: -

(1) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-

“(2) සැක දුරු කිරීම සඳහා, 82 වන වගන්තිය යටතේ බදු ගෙවීම සඳහා පමණක් ප්‍රාග්ධන ලාභ බදු වාර්තාවක් ස්වයං තක්සේරුවක් වන බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.”.

ප්‍රධාන ප්‍රඥප්තියට 96අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**23**. ප්‍රධාන ප්‍රඥප්තියේ 96 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 96අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

“හිඟ වැටුප් සඳහා බදු බැර වල අදාළත්වය

**96අ**. (1) සේවානියුක්තයකු තක්සේරු වර්ෂයක් තුළ දී යම් හිඟ වැටුපක් ලබා ගන්නා අවස්ථාවක දී ඒ සේවානියුක්තයා (2) වන උපවගන්තියට අනුකූලව ගණනය කරනු ලබන බදු බැර සඳහා හිමිකම් ලැබිය යුතු ය. ඒ බදු බැර, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ සේවානියුක්තයා විසින් ස්වකීය සේවානියුක්ති ආදායම මත ගෙවිය යුතු ආදායම් බද්දෙන් අඩු කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් බදු බැර පහත සඳහන් සූත්‍රයට අනුව ගණනය කරනු ලැබිය යුතු ය:-

$A = B - C$

'$A$' යනු, වර්තමාන තක්සේරු වර්ෂය සඳහා හිඟ වැටුප් මත සේවානියුක්තයා විසින් ගෙවිය යුතු ආදායම් බද්ද නොඉක්ම විය යුතු, මේ වගන්තිය යටතේ ඉඩ දෙනු ලබන බදු බැර වේ;

'$B$' යනු, හිඟ වැටුප් ද ඇතුළුව වර්තමාන තක්සේරු වර්ෂයේ මුළු සේවානියුක්ති ආදායම මත ගෙවිය යුතු ආදායම් බද්දෙන්, හිඟ වැටුප් හැර මුළු සේවානියුක්ති ආදායම මත ගෙවිය යුතු ආදායම් බද්ද අඩු කළ විට ලැබෙන මුදලට සමාන වන, වර්තමාන තක්සේරු වර්ෂය සඳහා හිඟ වැටුප් මත සේවානියුක්තයා විසින් ගෙවිය යුතු ආදායම් බද්ද වේ;

'$C$' යනු, හිඟ වැටුප් උපයන ලද එක් එක් පෙර තක්සේරු වර්ෂය සඳහා, ආදාළ වන බදු නීතිය ප්‍රකාරව ගණනය කරන ලද පරිදි ගෙවිය යුතු ආදායම් බද්ද වේ.

(3) මේ වගන්තියේ "හිඟ වැටුප්" යන්නෙන්, සේවානියුක්තියක නැවත සේවයේ පිහිටුවීම හෝ විනය පරීක්ෂණයකින් පසුව එම සේවානියුක්තියට ම නැවත පත් කිරීම, පෙර දිනයක සිට බලාත්මක වන පරිදි තනතුරකට උසස් කිරීම, පෙර තක්සේරු වර්ෂයක පෙර දිනයක සිට බලාත්මක වන පරිදි යම් වැටුප් වර්ධකයකට හිමිකම් ලැබීම සහ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන ඒ හා සමාන හේතුවල ප්‍රතිඵලයක් ලෙස වර්තමාන තක්සේරු වර්ෂය තුළ දී එහෙත් යම් පෙර තක්සේරු වර්ෂයකට අදාළව සේවානියුක්තයකුට එම සේවානියුක්තියෙන් ම ලැබෙන ලැබීම් සහ ලාභ අදහස් වේ.

(4) 83අ වන වගන්තිය යටතේ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද අඩු කරනු ලැබිය යුතු අවස්ථානුගත කරුණු නිශ්චිතව සඳහන් කිරීමේ දී කොමසාරිස් ජනරාල්වරයා විසින් මේ වගන්තිය යටතේ ප්‍රදානය කරනු ලබන බදු බැර සලකා බලනු ලැබිය යුතු ය.

(5) සේවානියුක්තයා විසින් මේ වගන්තියට අදාළව යම් ආපසු ගෙවීමේ හිමිකම් පෑමක් සිදු කිරීමේ දින සිට මාස තුනක් ඇතුළත, බදු විගණනයකට පෙරාතුව, කොමසාරිස් ජනරාල්වරයා විසින් එම ආපසු ගෙවිය යුතු මුදල් ප්‍රමාණය ගෙවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 100 වන වගන්තිය සංශෝධනය කිරීම

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 100 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඌ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ඌඅ) 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ, 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතේ සහ 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ විධිවිධාන යටතේ මුදල් විශුද්ධිකරණයට සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමට එරෙහිව අදාළ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ සහ කිරීමේ කාර්යය සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකයේ අධ්‍යක්ෂවරයාට;

(ඌආ) 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ සහ 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතේ විධිවිධාන යටතේ මුදල් විශුද්ධිකරණයට සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමට එරෙහිව අදාළ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ සහ කිරීමේ කාර්යය සඳහා, පොලිස්පතිවරයාට;

(ඖඇ) 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ කාර්ය සහ කර්තව්‍ය ඉටුකිරීමේ සහ කිරීමේ කාර්යය සඳහා, ඒ ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයට;”.

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 102 වන වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 102 වන වගන්තිය සංශෝධනය කිරීම

“(1අ) ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද හෝ ලියාපදිංචි කරන ලද සෑම සමාගමක් ම ඒ සංස්ථාගත කරන ලද හෝ ලියාපදිංචි කරන ලද දින සිට දින තිහකට නොවැඩි කාලයක් තුළ කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියාපදිංචි විය යුතු ය.”.

**26**. ප්‍රධාන ප්‍රඥප්තියේ 103 වන වගන්තියේ (5) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 103 වන වගන්තිය සංශෝධනය කිරීම

“(6) (අ) කොමසාරිස් ජනරාල්වරයා විසින් මේ වගන්තිය යටතේ TIN අංකයක් ලබා දී ඇති සෑම තැනැත්තකු වෙත ම TIN සහතිකයක් නිකුත් කළ යුතු ය.

(ආ) 2026 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, 102 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති තැනැත්තකු විසින් පහත *වගුවේ I වන තීරයේ* නිශ්චිතව දක්වා ඇති එක් එක් කාර්යය සඳහා TIN සහතිකයක් ඉදිරිපත් කිරීම අවශ්‍ය විය යුතු අතර, ඒ තැනැත්තා ඒ අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කරන බවට වගබලා ගැනීම *ඒ වගුවේ II වන තීරයේ* අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති අදාළ නිලධරයාගේ වගකීම විය යුතු ය:-

*වගුව*

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| කාර්යය | අදාළ නිලධරයා |
| යම් මූල්‍ය ආයතනයක යම් ගිණුමක් විවෘත කිරීම | මූල්‍ය ආයතනයේ කළමනාකාරවරයා |
| ගොඩනැගිලි සැලැස්මක් සඳහා අනුමතය ලබා ගැනීම | පළාත් පාලන ආයතනයේ සභාපතිවරයා, බලාත්මක කිරීමේ අධ්‍යක්ෂවරයා හෝ කොමසාරිස්වරයා |
| මෝටර් වාහනයක් ලියාපදිංචි කිරීම | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා |
| මෝටර් වාහනයක බලපත්‍රය අලුත් කිරීම | පළාත් ආදායම් කොමසාරිස්වරයා හෝ ප්‍රාදේශීය ලේකම්වරයා |
| ඉඩමක් හෝ ඉඩමක හිමිකමක් ලියාපදිංචි කිරීම | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා |
| ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම | ප්‍රාදේශීය ලේකම්වරයා |
| පැවරුම්ලාභියකු සහ පැවරුම්කරුවකු විසින් ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක කොටස් පැවරීම | සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා |
| ණය කාඩ්පතක් ලබා ගැනීම | බැංකුවේ හෝ ණය කාඩ්පත් නිකුත් කරන අස්ථිත්වයේ කළමනාකාරවරයා |

(ඇ) මේ උපවගන්තියේ කාර්යය සඳහා, TIN සහතිකය සත්‍යාපනය කිරීමේ විකල්ප ක්‍රමයක් සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා සහ (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති අදාළ නිලධරයා විසින් එකඟතාවයකට එළඹිය හැකි ය.

(ඈ) මේ උපවගන්තියේ විධිවිධාන ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබිය හැකි ය.

(7) මේ වගන්තියේ විධිවිධාන-

(අ) 102 වන වගන්තියේ විධිවිධාන යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබ ඇති තැනැත්තකුට; හෝ

(ආ) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන ප්‍රකාරව TIN සහතිකයක් ලබා ගැනීම වළක්වනු ලැබ ඇති තැනැත්තකුට,

අදාළ නොවිය යුතු ය.

(8) මේ පනතේ කාර්ය සඳහා TIN අංකයක් රහස්‍ය හෝ විශ්වාස්‍ය තොරතුරක් නොවිය යුතු ය.”.

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 113 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 113 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (1ආ) වන උපවගන්තියේ “(1ඇ) වන උපවගන්තියට යටත්ව,” යන වචන සහ ඉලක්කම් වෙනුවට, “(1ඇ) සහ (1ඈ) වන උපවගන්තිවලට යටත්ව,” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (1ඇ) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-

“(1ඈ) 2025 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ සිට බලාත්මක වන පරිදි, ජ්‍යෙෂ්ඨ පුරවැසියකු විසින් ඒ තැනැත්තාගේ බදු වාර්තා ලිඛිතව හෝ

පරිගණක පද්ධතියක් නැතහොත් ජංගම ඉලෙක්ට්‍රොනික උපාංගයක් මගින් ඉලෙක්ට්‍රොනිකව හෝ ගොනු කරනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 122 වන වගන්තිය සංශෝධනය කිරීම

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 122 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (8) වන උපවගන්තියේ “කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරන ලද” යන වචන වෙනුවට, “2026 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරන ලද” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (8) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

“(8අ) (අ) මේ වගන්තිය යටතේ හෝ 123 වන වගන්තිය යටතේ, 2026 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව කොමසාරිස් ජනරාල්වරයා විසින් විශේෂයෙන් ඉල්ලා සිටින ලද යම් ලේඛනයක් හෝ තොරතුරක් (ආ) ඡේදයේ නිශ්චිතව සඳහන් කර ඇති කාලසීමා තුළ සැපයීමට බදු ගෙවන්නකු හෝ වෙනත් තැනැත්තකු විසින් අපොහොසත් වන අවස්ථාවක දී, කොමසාරිස් ජනරාල්වරයාගේ එකඟත්වයෙන් හැර, ඒ ලේඛනය හෝ තොරතුර -

(i) තක්සේරු කිරීමක් අභියෝගයට ලක් කරමින් ඒ බදු ගෙවන්නා හෝ වෙනත් තැනැත්තා විසින් පවරන ලද යම් අධිකරණ ක්‍රියාවලියක දී පිළිගනු නොලැබිය යුතු ය;

(ii) 141 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි බදු ගෙවන්නාගේ ඔප්පු කිරීමේ භාරය නිදහස් කිරීමේ කාර්යය සඳහා වලංගු නොවිය යුතු ය; හෝ

(iii) බදු අභියාචන කොමිෂන් සභාවේ යම් අභියාචන කටයුත්තක කාර්යය සඳහා වලංගු නොවිය යුතු ය.

(ආ) මේ වගන්තිය යටතේ හෝ 123 වන වගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉල්ලා සිටින ලද යම් ලේඛනයක් හෝ තොරතුරක්-

(i) ඒ ලේඛනය හෝ තොරතුර ශ්‍රී ලංකාව තුළ දී ලබාගත හැකි අවස්ථාවක දී, මේ වගන්තිය යටතේ ඉල්ලීම කරනු ලැබූ දින සිට හෝ 123 වන වගන්තිය යටතේ දැන්වීම භාර දෙන ලද දින සිට මාස හයක් ඇතුළත; හෝ

(ii) ඒ ලේඛනය හෝ තොරතුර ශ්‍රී ලංකාව තුළ දී ලබාගත නොහැකි අවස්ථාවක දී, මේ වගන්තිය යටතේ ඉල්ලීම කරනු ලැබූ දින සිට හෝ 123 වන වගන්තිය යටතේ දැන්වීම භාර දෙන ලද දින සිට මාස නවයක් ඇතුළත,

ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ඇ) සැක දුරු කිරීම සඳහා, (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාවන් බදු නිලධරයන් විසින් තොරතුරු ලබාගැනීම සඳහා කරන ලද ඉල්ලීම් සඳහා අදාළ වන කාලසීමාවන්

දීර්ඝ කිරීමක් ලෙස සලකනු නොලැබිය යුතු බවටත්, යම් දැන්වීමක් මගින් බදු නිලධරයා විසින් ඉල්ලා සිටින යම් තොරතුරු සැපයීමේ දී බදු ගෙවන්නකු හෝ වෙනත් තැනැත්තකු ඒ දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාවලට අනුකූලව ක්‍රියා කළ යුතු බවටත් මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 135 වන වගන්තිය සංශෝධනය කිරීම

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 135 වන වගන්තියේ (6) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

“(7) 2025 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ සිට බලාත්මක වන පරිදි, (මේ උපවගන්තියේ “වර්තමාන තක්සේරු වර්ෂය” යනුවෙන් සඳහන් කරනු ලබන) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් පුද්ගලයකු-

(අ) 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ඒ පුද්ගලයාගේ බදු අය කළ හැකි ආදායම සම්බන්ධයෙන් ආදායම් වාර්තාවක් ගොනු කර ඇති සහ වර්තමාන තක්සේරු වර්ෂයට පෙරාතුව ම වූ තක්සේරු වර්ෂය සඳහා බදු අය කළ හැකි ආදායම මත ගෙවිය යුතු බද්දෙන් සියයට එකසිය විස්සකට නොඅඩු ප්‍රමාණයකින් ගෙවිය යුතු බද්ද ප්‍රකාශ කර ඇති අවස්ථාවක දී;

(ආ) ආපසු ගෙවීමක් සඳහා හිමිකම් පෑමකින් තොරව මුළු බදු මුදල ගෙවා ඇති අවස්ථාවක දී; සහ

(ඇ) වර්තමාන තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු බද්ද සම්බන්ධයෙන් කිසිදු වංචාවක්, මගහැරීමක් හෝ චේතනාන්විත පැහැර හැරීමක් සිදු කරනු ලැබ නොමැති බව ප්‍රකාශ කරමින් දිවුරුම් ප්‍රකාශයක් ලබා දී ඇති අවස්ථාවක දී,

ඒ පුද්ගලයා ඒ බදු වාර්තාව ගොනු කරනු ලැබ ඇති ලෙසට පිළිගනු ලැබිය යුතු අතර, වර්තමාන තක්සේරු වර්ෂය සඳහා මේ වගන්තිය යටතේ ඒ වාර්තාව මත කිසිදු සංශෝධිත තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් නිකුත් කරනු නොලැබිය යුතු ය.”.

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 150 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 150 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (2අ) වන උපවගන්තියේ (අ) ඡේදයේ අතුරු විධානය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අතුරු විධානය ආදේශ කිරීමෙන්:-

“එසේ වුවද, ඒ වාසික පුද්ගලයා වාරික ගෙවන්නකු නොවන ජ්‍යෙෂ්ඨ පුරවැසියකු වේ නම් සහ 2025 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව වූ ඔහුගේ ආපසු ගෙවීමේ හිමිකම්පෑම තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් හැටදහසක් නොඉක්මවන්නේ නම්, නැතහොත් ජුනි මස තිස්වන දිනයෙන්, සැප්තැම්බර් මස තිස්වන දිනයෙන්, දෙසැම්බර් මස තිස්එක් වන දිනයෙන් සහ මාර්තු මස තිස්එක් වන දිනයෙන් අවසන් වන යම් කාර්තුවක් සඳහා රුපියල් පහළොස් දහසක් නොඉක්මවන්නේ නම්, 2025 ජුනි මස 30 වන දිනයට පෙරාතුව කරන ලද ඒ ආපසු

ගෙවීමේ හිමිකම්පෑම ඒ වාසික පුද්ගලයා විසින් ඒ ආපසු ගෙවීමේ හිමිකම්පෑම සිදු කිරීමේ දින සිට මාස තුනක් ඇතුළත, බදු විගණනයකට පෙරාතුව ගෙවනු ලැබිය යුතු ය.”; සහ

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-

“(5) යම් තැනැත්තකු මුදල් පදනම මත ගිණුම්කරණය යටතේ ස්වකීය ආදායම ගණනය කිරීමේ දී යම් මුදල් ප්‍රමාණයක් ඇතුළත් කර ඇති අවස්ථාවක දී සහ මුල් ගිවිසුම අවලංගු කිරීමේ හෝ වෙනස් කිරීමේ හේතුවෙන් ඉන් යම් මුදල් ප්‍රමාණයක් පසුව ආපසු ගෙවනු ලැබ ඇති අවස්ථාවක දී, ඒ තැනැත්තා ස්වකීය ආදායම ගණනය කිරීමේ දී ඇතුළත් කර ඇති මුදල ආපසු ගෙවූ දින සිට මාස තිහක් ඇතුළත එසේ ආපසු ගෙවන ලද මුදල් ප්‍රමාණය මත ගෙවන ලද අතිරික්ත ආදායම් බද්ද මේ වගන්තිය යටතේ ආපසු ගෙවීමක් ලෙස ආපසු ලබා ගැනීම සඳහා ඉල්ලුම් කිරීමට ඒ තැනැත්තාට හිමිකමක් ඇත්තේ ය.”.

**31.** ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ “යම් තැනැත්තෙක්,” යන වචන වෙනුවට, “2026 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව, යම් තැනැත්තෙක්” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ “මේ වගන්තිය යටතේ” යන වචන වෙනුවට, “2026 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව, මේ වගන්තිය යටතේ” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(3) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "බදු අයකර ගැනීම සඳහා වන" යන වචන වෙනුවට, "2026 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව, බදු අයකර ගැනීම සඳහා වන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(4) ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන්:-

"(4අ) (අ) 2026 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ සිට බලාත්මක වන පරිදි, යම් තැනැත්තකු බද්ද ගෙවිය යුතුව තිබෙන විට එම බද්ද ගෙවීමට අපොහොසත් වන අවස්ථාවක දී, කොමසාරිස් ජනරාල්වරයා විසින් (4ආ) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති, ගෙවීම පැහැර හැර ඇති තැනැත්තා පිළිබඳ විස්තර ඇතුළත් සහතිකයක්, ඒ ගෙවීම පැහැර හැර ඇති තැනැත්තා පදිංචිව සිටින හෝ ගෙවීම පැහැර හැර ඇති තැනැත්තාගේ ව්‍යාපාරික ස්ථානය පිහිටා ඇති අධිකරණ බල සීමාව තුළ පිහිටි මහෙස්ත්‍රාත් අධිකරණයේ මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(ආ) (අ) ඡේදයේ සඳහන් සහතිකය ලැබීමෙන් පසුව මහෙස්ත්‍රාත්වරයා විසින්, ගෙවීම පැහැර හරින ලද බදු අයකර ගැනීම සඳහා ඒ ගෙවීම පැහැර හැර ඇති තැනැත්තාට විරුද්ධව වැඩිදුර ක්‍රියාමාර්ග නොගත යුත්තේ මන්ද යන්නට හේතු දැක්වීමට ගෙවීම පැහැර හැර ඇති තැනැත්තා ඒ මහෙස්ත්‍රාත්වරයා ඉදිරියට කැඳවනු ලැබිය යුතු ය.

(ඇ) මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත්වන පරිදි ප්‍රමාණවත් හේතු දැක්වීමට ගෙවීම

පැහැර හැර ඇති තැනැත්තා අපොහොසත් වන අවස්ථාවක දී, ගෙවීම පැහැර හරින ලද බද්ද, දඩයකින් පමණක් දඬුවම් කළ හැකි හා බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ නොහැකි වරදක් සඳහා මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ ගෙවීම පැහැර හැර ඇති තැනැත්තා වෙත දණ්ඩන නියමයක් මගින් පනවන ලද දඩයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(ඈ) වරදක් සඳහා පනවන ලද දඩයක් ගෙවීම පැහැර හැරීමට අදාළව වන 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ), (ඈ) සහ (ඵ) ඡේදවල විධිවිධාන හැර ඒ උපවගන්තියේ විධිවිධාන එවිට ඊට අදාළ විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ දණ්ඩන නියමය සිදු කරන අවස්ථාවේ දී ඒ උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මහෙස්ත්‍රාත්වරයා විසින් සිදු කළ හැකි යම් විධානයක් කරනු ලැබිය හැකි ය.

(4ආ) (4අ) වන උපවගන්තියේ සඳහන් සහතිකයෙහි, මෙහි උපවගන්තිය ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ගෙවිය යුතු යම් බද්දක්, පොලියක්, දණ්ඩනයක් හෝ වෙනත් මුදල් ප්‍රමාණයක් ගෙවීම පැහැර හැර ඇති තැනැත්තාගේ නම සහ අවසාන වරට දැන සිටි ව්‍යාපාරික ස්ථානයේ හෝ පදිංචි ස්ථානයේ ලිපිනය, ඇතුළුව මේ පනත යටතේ ගෙවිය යුතු බද්ද, පොලිය, දණ්ඩනය හෝ වෙනත් යම් මුදල් ප්‍රමාණයක් පිළිබඳ විස්තර ඇතුළත් විය යුතු ය.

(4ඇ) කොමසාරිස් ජනරාල්වරයා විසින්, 151 වන වගන්තිය යටතේ බදු ගෙවිය යුතු කාලය දීර්ඝ කිරීමක් ලබා දී ඇත්නම් මිස,

(4අ) වන උපවගන්තියේ කාර්යය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉදිරිපත් කරන ලද සහතිකයක ඇති යම් ප්‍රකාශයක නිරවද්‍යතාවය පිළිබඳව මේ වගන්තිය යටතේ වූ නඩු කටයුත්තක දී මහෙස්ත්‍රාත්වරයා විසින් ප්‍රශ්න කිරීම හෝ විභාග කිරීම නොකළ යුතු අතර, ඒ අනුව ඒ උපවගන්තියේ සඳහන් කිසිවක්, ඒ සහතිකයේ ඇති යම් ප්‍රකාශයක නිරවද්‍යතාවය සලකා බැලීමට හෝ ඒ පිළිබඳව තීරණය කිරීමට හෝ ගෙවීම පැහැර හරින ලද බදු අයකර ගැනීම සම්බන්ධයෙන් වන තක්සේරුවට විරුද්ධව අභියාචනයක් විභාග වෙමින් පැවතීම යන කාරණය නිසාම පමණක් ඒ නඩු කටයුතු දින තිහක් ඉක්මවන කාලසීමාවක් සඳහා කල් තැබීමට හෝ ප්‍රමාද කිරීමට මහෙස්ත්‍රාත්වරයකුට බලය ලබාදීමක් ලෙස කියවා තේරුම් නොගත යුතු ය.

(4ඇ) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සිට (5) වන උපවගන්තිය දක්වා වූ උපවගන්තිවල ඇතුළත් කිසිවක්, (4අ) වන උපවගන්තියේ සඳහන් යම් අවස්ථාවකට අදාළ නොවිය යුතු ය.

(4ඉ) (4අ) වන උපවගන්තිය මගින් ගෙවීම පැහැර හැර ඇති තැනැත්තකු මත පනවන ලදැයි සලකනු ලබන දඩය ගෙවීම පැහැර හැරීම හේතුවෙන් ගෙවීම පැහැර හැර ඇති තැනැත්තා වෙත බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයක් පනවනු ලබන (4අ) වන උපවගන්තියේ සඳහන් යම් අවස්ථාවක දී, (6) වන උපවගන්තියට යටත්ව මහෙස්ත්‍රාත්වරයා

විසින් ඒ දඩ මුදල ගෙවීමට කාලය ලබා දීම හෝ ඒ මුදල වාරික වශයෙන් ගෙවන ලෙසට විධාන කිරීම හෝ කළ හැකි ය.

(4ඊ) (4අ) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි හේතු දැක්වීමට හෝ (4ඉ) වන උපවගන්තිය යටතේ දඩය ගෙවීමට කාලය ලබාදීම සඳහා පූර්ව කොන්දේසියක් ලෙස මහෙස්ත්‍රාත්වරයා විසින් ඇප තැබීමට නියම කරනු ලැබිය හැකි අතර, ගෙවීම පැහැර හැර ඇති තැනැත්තාට ඇප තැබීමට එසේ නියම කරනු ලබන අවස්ථාවක 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XXXIV වන පරිච්ඡේදයේ විධිවිධාන අදාළ විය යුතු ය.

(4උ) වාරික වශයෙන් ගෙවීම කිරීමට මහෙස්ත්‍රාත්වරයා විසින් (4ඉ) වන උපවගන්තිය යටතේ විධාන කරන අවස්ථාවක දී සහ ඒ වාරිකවලින් යම් වාරිකයක් ගෙවීම පැහැර හරිනු ලබන අවස්ථාවක දී, ඒ වන විට නොගෙවා ඉතිරිව ඇති සියලුම වාරික ගෙවීම පැහැර හරිනු ලැබ ඇති ලෙස සලකා නඩු කටයුතු පවරනු ලැබිය හැකි ය.

(4ඌ) (4අ) වන උපවගන්තිය යටතේ වූ යම් නඩු කටයුත්තක දී, කොමසාරිස් ජනරාල්වරයාගේ සහතිකය, බද්ද යථා පරිදි තක්සේරු කර ඇති බවට සහ එය ගෙවීම පැහැර හැර ඇති බවට ප්‍රමාණවත් සාක්ෂියක් විය යුතු අතර, බද්ද අධික බවට, බද්ද වැරදි සහගත බවට හෝ ඊට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කොට ඇති බවට කරනු ලබන කවර හෝ උත්තරවාදයක් පිළිගනු නොලැබිය යුතු ය.”;

(5) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ “(3) වන උපවගන්තියේ” යන වචන සහ ඉලක්කම වෙනුවට, “(3) වන උපවගන්තියේ හෝ (4අ) වන උපවගන්තියේ” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(6) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ “(3) වන උපවගන්තියේ” යන වචන සහ ඉලක්කම වෙනුවට, “(3) වන උපවගන්තියේ හෝ (4අ) වන උපවගන්තියේ” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියට 175අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**32.** ප්‍රධාන ප්‍රඥප්තියේ 175 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 175අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

“සිතාසි සහ දැන්වීම් භාරදීම

**175අ.** 100 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුවද, මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ යම් අධිකරණයක් විසින් යම් දැන්වීමක්, පෙනී සිටින ලෙසට වූ දැන්වීමක් හෝ සිතාසියක් නිකුත් කර ඇති අවස්ථාවක දී සහ ඒ දැන්වීම හෝ සිතාසිය අදාළ තැනැත්තාට භාරදීමට හෝ භාරදීමට සැලැස්වීමට කොමසාරිස් ජනරාල්වරයාට හෝ ඒ අධිකරණයට නොහැකි වන අවස්ථාවක දී, ඒ දැන්වීම හෝ සිතාසිය භාරදීමට හෝ භාරදීමට සැලැස්වීමට නොහැකි වීම සඳහා වන හේතු සටහන් කිරීමෙන් අනතුරුව, ඒ දැන්වීම හෝ සිතාසිය පිළිබඳව යථා පරිදි දැනුම් දීමේ කාර්යය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ ඒ අධිකරණය විසින් ඒ දැන්වීමේ හෝ සිතාසියේ විස්තර සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ භාෂාවලින්

සංසරණය වන යම් පුවත්පතක පළ කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියට 178අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**33**. ප්‍රධාන ප්‍රඥප්තියේ 178 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 178අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය.

“රඳවා ගැනීමේ අනුයෝජිතයන් සහ පුද්ගලයන් විසින් අනුකූලව කටයුතු නොකිරීම

**178අ.** (1) 86 වන වගන්තියේ (9) වන උපවගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති නියමයන්ට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන රඳවා ගැනීමේ අනුයෝජිතයකු, (2) වන උපවගන්තියට යටත්ව, තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන මුදලක දණ්ඩනයකට යටත් විය යුතු ය.

(2) (අ) (1) වන උපවගන්තිය යටතේ දණ්ඩනයක් තක්සේරු කිරීමට පෙරාතුව, කොමසාරිස් ජනරාල්වරයා විසින් අවවාදාත්මක දැන්වීමක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ නිකුත් කරන ලද අවවාදාත්මක දැන්වීම භාරදුන් දිනයේ සිට දින දාහතරක් ඇතුළත ඒ දැන්වීමට අනුකූලව රඳවා ගැනීමේ අනුයෝජිතයා කටයුතු කරන අවස්ථාවක දී, (1) වන උපවගන්තිය යටතේ කිසිදු දණ්ඩනයක් පැනවීම නොකළ යුතු ය.

(3) අසත්‍ය හෝ නොමඟ යවන සුළු විස්තර සහිතව 84 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ ස්වයං ප්‍රකාශයක් සපයනු ලබන පුද්ගලයකු, (4) වන උපවගන්තියට යටත්ව, රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන මුදලක දණ්ඩනයකට යටත් විය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ දණ්ඩනයක් තක්සේරු කිරීමට පෙරාතුව, කොමසාරිස් ජනරාල්වරයා විසින්, ඒ පුද්ගලයා විසින් සපයන ලද ස්වයං ප්‍රකාශයේ අන්තර්ගත අසත්‍ය සහ නොමඟ යවන සුළු විස්තර පිළිබඳ දැන්වීමක් ඒ පුද්ගලයා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(5) (3) වන උපවගන්තිය යටතේ දණ්ඩනයකට යටත්ව ඇති පුද්ගලයකු (4) වන උපවගන්තිය යටතේ දැන්වීමක් නිකුත් කරනු ලැබ ඇති ප්‍රකාශය වෙනුවට වෙනත් ස්වයං ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට හිමිකම් නොලැබිය යුතු ය.”.

**34.** ප්‍රධාන ප්‍රඥප්තියේ 185 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් පරිච්ඡේදය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ XVIIඅ වන පරිච්ඡේදය ලෙස බලාත්මක විය යුතු ය:-

ප්‍රධාන ප්‍රඥප්තියට XVIIඅ වන අලුත් පරිච්ඡේදය ඇතුළත් කිරීම

“XVIIඅ වන පරිච්ඡේදය

වැරදි සඳහා නඩු පැවරීම

වාර්තා ආදියට අදාළ වැරදි සඳහා නඩු පැවරීම

**185අ.** (1) යම් තැනැත්තකු විසින් -

(අ) 86 වන වගන්තිය මගින් නියම කර ඇති පරිදි වාර්ෂික වාර්තාවක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ගොනු කිරීමට;

(ආ) 93 වන වගන්තිය යටතේ ආදායම් වාර්තාවක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ගොනු කිරීමට;

(ඇ) 102 වන වගන්තිය යටතේ නියම කර ඇති පරිදි කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියාපදිංචි වීමට;

(ඈ) 123 වන වගන්තිය යටතේ දෙන ලද දැන්වීමකට අනුකූලව කොමසාරිස් ජනරාල්වරයා ඉදිරියේ පෙනී සිටීමට; සහ

(ඉ) 126 වන වගන්තිය යටතේ බදු වාර්තාවක් ඉදිරිපත් කිරීමට,

අපොහොසත් වන අවස්ථාවක දී, කොමසාරිස් ජනරාල්වරයා විසින්, දැන්වීම භාරදුන් දිනයේ සිට දින තිහක් ඇතුළත ඒ තැනැත්තා විසින් මේ පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම සඳහා අවශ්‍ය පියවර ගනු නොලැබුවහොත් මේ වගන්තිය යටතේ ඔහුට විරුද්ධව නඩු කටයුතු ආරම්භ කරන බව සඳහන් කරමින් ලිඛිත දැන්වීමක් ඒ තැනැත්තාට භාරදිය යුතු ය.

(2) සාධාරණ හේතුවක් නොමැතිව, (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද දැන්වීමට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කිරීමේ දී, රුපියල් ලක්ෂ හතරක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.”.

**35**. ප්‍රධාන ප්‍රඥප්තියේ 193 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 193 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ, "ඉල්ලීමක් කරනු ලබන්නේ නම් පමණක්" යන වචන වෙනුවට, "ඉල්ලීමක් කරනු ලබන්නේ නම් හා (1) වන උපවගන්තියේ සඳහන් නියමයට අනුකූලව කටයුතු කරන්නේ නම් පමණක්" යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(2අ) (1) (අ) යම් තැනැත්තකු විසින් වරදක් සමථයකට පත් කරන ලෙස ඉල්ලීමක් කරනු ලබන අවස්ථාවක දී, ඔහු විසින් ගොනු කරන ලද යම් අභියාචනයක් හෝ ඒ අභියාචනයේ අන්තර්ගත අභියාචනයට පදනම් වන යම් හේතුවක්, ඒ අභියාචනය හෝ ඒ හේතුව, සමථයකට පත් කරන ලෙස ඉල්ලා සිටින වරදට අදාළ වන තාක් දුරට, ඒ තැනැත්තා විසින් ඉල්ලා අස්කර ගැනීමට භාර ගත යුතු ය.

(ආ) අභියාචනයක, සමථයකට පත් කරන ලෙස ඉල්ලා සිටින වරදට අදාළ හේතු සහ මේ පනත යටතේ වෙනත් කාරණාවලට අදාළ හේතු අන්තර්ගත වන අවස්ථාවක දී, (අ) ඡේදයේ සඳහන් භාර ගැනීම සමථයකට පත් කරන ලෙස ඉල්ලා සිටින වරදට අදාළ හේතු සඳහා

පමණක් අදාළ විය යුතු අතර, වෙනත් කාරණාවලට අදාළ හේතු සම්බන්ධයෙන් අභියාචනය දිගටම පවත්වාගෙන යා හැකි ය.”; සහ

(3) ඒ වගන්තියේ (7) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන්:-

“(8) මේ වගන්තිය යටතේ වරදක් සමථයකට පත් කරන ලෙස ඉල්ලීමක් සිදු කරන විට, අය කළ යුතු ගාස්තුව කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය.

(9) වරදක්, වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ වන වරදකට හෝ යම් නීතිය බලාත්මක කිරීමේ නියෝජ්‍යායතනයක් විසින් සිදු කරනු ලබන විමර්ශනයකට සෘජුව ම අදාළ වන්නේ නම් හෝ සම්බන්ධ වන්නේ නම්, කොමසාරිස් ජනරාල්වරයා විසින් මේ පනත යටතේ ඒ වරද සමථයකට පත් කරනු නොලැබිය යුතු ය.”.

**36.** ප්‍රධාන ප්‍රඥප්තියේ 195 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 195 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) “බලයලත් නියෝජිතයා යන යෙදුමේ අර්ථ නිරූපණයේ (අ) ඡේදයේ (iv) වන අනුඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන්:-

“(iv) 2000 අංක 21 දරන ශ්‍රී ලංකා බඳුකරණ කාර්යාතනය (සංස්ථාගත කිරීමේ) පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා වරලත් බදුකරණ කාර්යාතනයේ සාමාජිකයකු;”;

(2) “සමාගම” යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

“ “ආගමන හා විගමන පාලකවරයා” යන්නෙන්, (351 වන අධිකාරය වූ) ආගාමික හා විගාමික පනතේ 4 වන වගන්තිය යටතේ පත් කරන ලද ආගමන හා විගමන පාලකවරයා අදහස් වේ;”;

(3) “පොලිය” යන යෙදුමේ අර්ථ නිරූපණයේ-

(අ) (අ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

“(අ) ප්‍රාග්ධනය ආපසු ගෙවීමක් නොවන ණය බැඳීමක් යටතේ කරන ලද, වට්ටමක් හෝ වාරිකයක් ඇතුළුව ගෙවීමක්;” සහ

(ආ) (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

“(ඇ) ණය බැඳීමක් හෝ හුවමාරු ගිවිසුමක් සම්බන්ධයෙන් පොරොන්දුවක්, ඇපයක් හෝ ගෙවන ලද සේවා ගාස්තුවක්; සහ”; සහ

(4) "රාජ්‍ය නොවන සංවිධානය" යන යෙදුමේ අර්ථ නිරූපණයේ "ඊට අනුමත පුණ්‍ය ආයතනයක් ඇතුළත් නොවන්නේ ය;" යන වචන වෙනුවට, "ඊට මේ පනතේ පස්වන උපලේඛනයේ 1 වන ඡේදයේ (අ) උපඡේදයේ සඳහන් පුණ්‍ය ආයතනයක් ඇතුළත් නොවන්නේ ය;" යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන්.

**37.** ප්‍රධාන ප්‍රඥප්තියේ 202 වන වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 202 වන වගන්තිය සංශෝධනය කිරීම

"(2අ) සැක දුරු කිරීම සඳහා-

(අ) 2018 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව වූ යම් තක්සේරු වර්ෂයක් සඳහා ඉවත් කරන ලද පනතේ 32 වන වගන්තිය, 33 වන වගන්තිය හෝ 34 වන වගන්තිය යටතේ යම් මුදල් ප්‍රමාණයක් අඩු කරනු ලැබ ඇත්නම්, ඉවත් කරන ලද පනත යටතේ වූ එවැනි අඩු කිරීමක යම් අඩු නොකරන ලද ශේෂයක් 2018 අප්‍රේල් මස 1 වන දින වන විට ඉතිරිව තිබුණ ද, එවැනි යම් මුදල් ප්‍රමාණයක් මේ පනත යටතේ අඩු කිරීමට;

(ආ) ඉවත් කරන ලද පනතේ 137 වන වගන්තිය හෝ 138 වන වගන්තිය යටතේ වන මතිමාත්‍ර බදු බැර සඳහා හෝ 2018 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඉවත් කරන ලද පනත යටතේ ප්‍රදානය කරන ලද වෙනත් යම් බදු බැර සඳහා වන යම් ඉල්ලීමකට; සහ

(ඇ) 2018 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු

වර්ෂයක් සඳහා ඉවත් කරන ලද පනත යටතේ වන යම් බදු අනුප්‍රමාණයක් හෝ බදු නිදහස් කිරීමක් අදාළ කර ගැනීමට,

(2) වන උපවගන්තිය අදාළ නොවිය යුතු බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.''.

**38.** ප්‍රධාන ප්‍රඥප්තියේ 203 වන වගන්තියේ (5) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 203 වන වගන්තිය සංශෝධනය කිරීම

“(6) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව, ඒ පනතේ අදාළ විධිවිධානවල නිශ්චිතව දක්වා ඇති යම් කාලසීමාවක් සඳහා යම් තැනැත්තකුගේ සම්පූර්ණ ලාභවලට සහ ආදායම්වලට හෝ ලාභවල සහ ආදායම්වල යම් කොටසකට සහන බදු අනුපාතිකයක් අදාළ වන අවස්ථාවක දී සහ එසේ නිශ්චිතව දක්වන ලද කාලසීමාව 2018 මාර්තු මස 31 වන දින වන විට ඉකුත් වී නොමැති අවස්ථාවක දී, එසේ නිශ්චිතව දක්වන ලද කාලසීමාව ඉකුත්වන තෙක් ඒ සහන බදු අනුපාතිකය අදාළ විය යුතු ය:

එසේ වුවද, එවැනි යම් සහන බදු අනුපාතිකයක් 2025 මාර්තු මස 31 වන දිනට පසුව අදාළ නොවිය යුතු ය.''.

**39.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම

(1) ඒ උපලේඛනයේ 1 වන ඡේදයේ (2) වන උපඡේදයේ (අ) වන අයිතමයේ “එම ලැබීම් මත 10%ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය;'' යන වචන සහ ඉලක්කම් වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"එම ලැබීම් මත-

(i) 1 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් විධිවිධාන ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව, 10%ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය; සහ

(ii) 1 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් විධිවිධාන ක්‍රියාත්මක වන දින සිට, 15% ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය;";

(2) ඒ උපලේඛනයේ 2 වන ඡේදයේ (2) වන උපඡේදයේ (අ) වන අයිතමයේ "එම ලැබීම් මත, 10%ක අනුප්‍රමාණයකින් හවුල් ව්‍යාපාරයට බදු පැනවිය යුතු ය; සහ" යන වචන සහ ඉලක්කම් වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"එම ලැබීම් මත-

(i) 1 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් විධිවිධාන ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව, 10%ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය; සහ

(ii) 1 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් විධිවිධාන ක්‍රියාත්මක වන දින සිට, 15% ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය; සහ";

(3) ඒ උපලේඛනයේ 3 වන ඡේදයේ (2) වන උපඡේදයේ (අ) වන අයිතමයේ "එම ලැබීම් මත, 10%ක අනුප්‍රමාණයකින් භාරයට බදු පැනවිය යුතු ය; සහ" යන වචන සහ ඉලක්කම් වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

“ එම භාරයට එම ලැබීම් මත-

(i) 1 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් විධිවිධාන ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව, 10%ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය; සහ

(ii) 1 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් විධිවිධාන ක්‍රියාත්මක වන දින සිට, 30%ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය; සහ”;

(4) ඒ උපලේඛනයේ 4 වන ඡේදයේ (2ආ) වන උපඡේදයේ (ආ) වන අයිතමයේ “යම් මත්පැන් හෝ” යන වචන වෙනුවට, “යම් මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදනයන් අපනයනය කිරීමෙන් හැර, යම් මත්පැන් හෝ” යන වචන ආදේශ කිරීමෙන්;

(5) ඒ උපලේඛනයේ 5 වන ඡේදයේ (2) වන උපඡේදයේ (අ) වන අයිතමයේ “එම ලැබීම් මත 10%ක අනුප්‍රමාණයකින් ඒකක භාරයට හෝ අන්‍යෝන්‍ය අරමුදලට බදු පැනවිය යුතු ය; සහ” යන වචන සහ ඉලක්කම් වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

“එම ඒකක භාරයට හෝ අන්‍යෝන්‍ය අරමුදලට එම ලැබීම් මත-

(i) 1 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් විධිවිධාන ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව, 10%ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය; සහ

(ii) 1 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් විධිවිධාන ක්‍රියාත්මක වන දින සිට, 30%ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය; සහ''; සහ

(6) ඒ උපලේඛනයේ 7 වන ඡේදයේ (2) වන උපඡේදයේ (අ) වන අයිතමයේ ''එම ලැබීම් මත 10%ක අනුප්‍රමාණයකින් එම රාජ්‍ය නොවන සංවිධානය වෙත බදු පැනවිය යුතු ය; සහ'' යන වචන සහ ඉලක්කම් වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

''එම රාජ්‍ය නොවන සංවිධානයට එම ලැබීම් මත-

(i) 1 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් විධිවිධාන ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව, 10%ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය; සහ

(ii) 1 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් විධිවිධාන ක්‍රියාත්මක වන දින සිට, 30%ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය; සහ''.

**40.** ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ 1 වන ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම

(1) ඒ ඡේදයේ (1අ) වන උපඡේදයේ ''ප්‍රාග්ධන දීමනා ප්‍රදානය කරනු ලැබිය යුතු ය.'' යන වචන වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

''ප්‍රාග්ධන දීමනා ප්‍රදානය කරනු ලැබිය යුතු ය:

එසේ වුවද, ඒ තැනැත්තා මේ උපඡේදය යටතේ වැඩිකළ ප්‍රාග්ධන දීමනා සඳහා සුදුසුකම් ලැබීම පිණිස ඒ පවත්නා ව්‍යවසාය පුළුල් කිරීම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් විශේෂයෙන් ම අනුමත කරනු ලැබ තිබිය යුතු ය.”; සහ

(2) ඒ ඡේදයේ (2) වන උපඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපඡේදය ඇතුළත් කිරීමෙන්:-

“(2අ) තක්සේරු වර්ෂයක් තුළ දී, අස්පෘශ්‍ය වත්කම් හැර, ශ්‍රී ලංකාවේ යම් කොටසක් තුළ අලුත් ව්‍යවසායයක් සඳහා භාවිත කරන ලද ක්ෂය විය හැකි වත්කම් මත තැනැත්තකු විසින් සිදු කරන ලද ආයෝජනය, ඇ.ඩො.250,000ක් ඉක්මවන නමුත් ඇ.ඩො. මිලියන 3ක් නොඉක්මවන්නේ නම්, ඒ තක්සේරු වර්ෂය සඳහා, ඒ ව්‍යවසාය සඳහා භාවිත කරන ලද ඒ ක්ෂය විය හැකි වත්කම් මත කරන ලද ආයෝජනයට 100%කට සමාන ප්‍රාග්ධන දීමනාවක් ඒ තැනැත්තාට ප්‍රදානය කරනු ලැබිය යුතු ය.”.

**41**. ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය සංශෝධනය කිරීම

(1) ඒ උපලේඛනයේ (අ) ඡේදයේ (iv) වන උපඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපඡේදය ආදේශ කිරීමෙන්:-

“(iv) (අ.) 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත පාසලක් නොවන, අධ්‍යාපන අමාත්‍යාංශය

සමඟ ලියාපදිංචි වී ඇති සහ රජය විසින් සහ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ අනුගමනය කිරීමට බැඳී සිටින, රජයේ ආධාර ලබන යම් පෞද්ගලික පාසලක් මගින්;

(ආ.) මේ උපඡේදයේ කාර්ය සඳහා, ''රජයේ ආධාර ලබන පෞද්ගලික පාසලක්'' යන්නෙන්, මූල්‍යමය සහාය ආකාරයෙන් හෝ එහි කටයුතු පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩ ආකාරයෙන් නිරන්තරයෙන් රජයෙන් සහාය ලැබෙන පෞද්ගලික පාසලක් අදහස් වේ;'';

(2) ඒ උපලේඛනයේ (එ) ඡේදයේ (ii) වන උපඡේදයේ ''ශ්‍රී ලංකාවෙන් පිටත'' යන වචන වෙනුවට, ''ණය මුදල බැංකුවක් හරහා විදේශීය ව්‍යවහාර මුදල්වලින් ශ්‍රී ලංකාව වෙත ප්‍රේෂණය කරනු ලබන බවට සහ ණය මුදලෙහි මුදල් ශ්‍රී ලංකාව තුළ භාවිත කරනු ලබන බවට වන කොන්දේසිවලට යටත්ව, ශ්‍රී ලංකාවෙන් පිටත'' යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ උපලේඛනයේ (ණ) ඡේදයේ ''84 වන වගන්තියේ'' යන වචන සහ ඉලක්කම් වෙනුවට, ''එක් එක් තැනැත්තා විසින් උපයන ලද එක් එක් මුදල් ප්‍රමාණය 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනත මගින් පිහිටුවන ලද ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද මාසික බදු වාර්තාවේ පෙන්නුම් කරනු ලබන තාක් දුරට, 84 වන වගන්තියේ'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(4) ඒ උපලේඛනයේ (තත) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

“(තතත) ගුවන් යානා, මෘදුකාංග බලපත්‍ර හෝ වෙනත් අදාළ සේවාවන් සඳහා වන යම් ගෙවීමක් ලෙස, ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් යම් නිර්වාසික තැනැත්තකු විසින් 2025 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව උපයන ලද යම් මුදලක්;” සහ

(5) ඒ උපලේඛනයේ (බ) ඡේදයේ “පනතේ එක් එක් තක්සේරු වර්ෂය සඳහා විධිවිධාන සලස්වා ඇති තාක්දුරට” යන වචන වෙනුවට, “පනතේ විධිවිධානවලට සහ ඒ යටතේ සාදනු ලබන යම් නියෝගවලට යටත්ව,” යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ හතරවන උපලේඛනය සංශෝධනය කිරීම

**42.** ප්‍රධාන ප්‍රඥප්තියේ හතරවන උපලේඛනයේ 2 වන ඡේදයේ (5) වන උපඡේදයේ (ආ) වන අයිතමයේ “ගමනාගමනය සඳහා හෝ” යන වචන වෙනුවට, “ප්‍රවාහනය සඳහා හෝ” යන වචන ආදේශ කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය සංශෝධනය කිරීම

**43.** ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනයේ 1 වන ඡේදයේ (අ) උපඡේදයේ (i) වන අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

“(i) (අ.) රෝගීන් හෝ අසරණ අයට ආයතනික සත්කාර සැලසීම සඳහා පිහිටුවන ලද පුණ්‍ය ආයතනයකට; හෝ

(ආ.) 2025 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, සමාජ සේවා සංවිධාන ලියාපදිංචි කිරීම සඳහා තත්කාලයේ

බලපවත්නා යම් නීතියක් යටතේ සංස්ථාගත කරන ලදුව හෝ ලියාපදිංචි කරන ලදුව, ආණ්ඩුවේ සෞඛ්‍ය රැකවරණ සේවා හෝ අධ්‍යාපන සේවා සමග සහයෝගීතාවයෙන් සෞඛ්‍ය රැකවරණ පහසුකම් සපයන ආයතනයකට; සහ".

*ප්‍රධාන ප්‍රඥප්තියේ හයවන උපලේඛනය සංශෝධනය කිරීම*

**44**. ප්‍රධාන ප්‍රඥප්තියේ හයවන උපලේඛනයේ 4 වන ඡේදයේ (1) වන උපඡේදයේ "යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන වෙනුවට, "2025 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව වූ යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*අඩුවෙන් කරන ලද ගෙවීම් සහ ප්‍රමාදව කරන ගෙවීම් මත වන යම් පොලියක් කපා හැරීම*

**45**. (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, කොමසාරිස් ජනරාල්වරයා විසින්, පහත දැක්වෙන පනත් යටතේ, එනම්-

(අ) 2023 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන තක්සේරු වර්ෂය තෙක්, ප්‍රධාන ප්‍රඥප්තියේ 157 වන වගන්තිය;

(ආ) 2022 අංක 14 දරන අධිභාර බද්ද පනත; හෝ

(ඇ) ණය ආපසු ගෙවීමේ අය බද්ද මත, 2018 අංක 35 දරන මුදල් පනත,

යටතේ අඩුවෙන් කරන ලද ගෙවීම් සහ ප්‍රමාදව කරන ගෙවීම් මත අය කරනු ලැබිය හැකි සහ නොගෙවා ඉතිරිව ඇති යම් පොලියක් කපා හරිනු ලැබිය යුතු ය.

(2) කොමසාරිස් ජනරාල්වරයා විසින්, අදාළ තක්සේරු වර්ෂය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් අත්හරින ලද යම් මුදල් ප්‍රමාණයක් හැර සම්පූර්ණ බදු මුදල සහ යම් අදාළ දණ්ඩන, 1 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් විධිවිධාන ක්‍රියාත්මක වන දිනයේ සිට මාස හයක කාලසීමාවක් ඉකුත්වීමට පෙරාතුව

ගෙවනු ලබන බවට වන කොන්දේසියට යටත්ව, (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පොලිය කපා හරිනු ලැබිය යුතු ය.

(3) සැක දුරු කිරීම සඳහා -

(අ) බදු ගෙවන්නකු විසින්, (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිය, 1 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් විධිවිධාන ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව සම්පූර්ණ කරනු ලැබ ඇති අවස්ථාවක දී, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ බදු ගෙවන්නා (2) වන උපවගන්තියේ නියමයන්ට අනුකූලව කටයුතු කර ඇති ලෙස සලකනු ලැබිය යුතු බවට;

(ආ) මේ වගන්තිය අදාළ වීමේ කාර්යය සඳහා, කොමසාරිස් ජනරාල්වරයා විසින්, තක්සේරු වර්ෂ හෝ බදු අය කළ හැකි කාල පරිච්ඡේද වෙන් වෙන් වශයෙන් සලකනු ලැබිය යුතු බවට; සහ

(ඇ) කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රධාන ප්‍රඥප්තියේ 154 වන වගන්තිය යටතේ යම් බදු ගෙවීමක මුල් බදු මුදල් ප්‍රමාණය බද්දට අදාළ පොලිය ලෙස අදාළ කරනු ලැබ ඇති අවස්ථාවක දී, පොලිය ලෙස එසේ අදාළ කර ගනු ලැබූ මුදල් ප්‍රමාණය, මේ වගන්තිය අදාළ වීමේ කාර්යය සඳහා පමණක් මුල් බදු මුදල් ප්‍රමාණය ලෙස සලකනු ලැබිය යුතු බවට,

මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

**46**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව